**දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ සහ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල - 2014**

---

දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ සහ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අන්තර්ජාතික සහයෝගීතාව සඳහා ජපාන බැංකුව, වර්තමානයේ අන්තර්ජාතික සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය අතර 2008 ජූලි 29 දින එළඹි අංක එස්එල්-පී 94 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය II ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දිළිඳු ජනතාවගේ ආදායම් මට්ටම වැඩි දියුණු කිරීම හා ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීමෙන් ඔවුන් සඳහා විධිමත් මූල්‍ය සේවා පුළුල් කිරීම, සහභාගීත්ව මූල්‍ය ආයතන හා හවුල්කාර නියෝජිතායතනවල කළමනාකරණ හා පුහුණු ධාරිතාව වැඩි දියුණු කිරීම සහ ප්‍රතිලාභීන්ගේ ආදායම් ඉපයීමේ අවස්ථා හා කුසලතා වර්ධනය කිරීම මගින් දිළිඳුකම පිටුදැකීමට සහය වීම, ප්‍රාදේශීය අසමානතා අවම කිරීම සහ සාමය ගොඩ නැංවීමට උපකාරී වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 2,759 කට සමාන රු. මිලියන 3,076 ක් වන අතර ඉන් ජපන් යෙන් මිලියන 2,575 කට සමාන රු. මිලියන 2,704 ක් අන්තර්ජාතික සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 ජනවාරි ආරම්භ කළ අතර 2013 දෙසැම්බර් අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් අවසන් ණය වියපැහැදම් කිරීම සඳහා ණය ක්‍රියාත්මක වීමේ දිනය 2015 නොවැම්බර් 12 වෙනිදා දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය ඇති කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට ඇතුළත්ව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිළිබඳ එවැනි පරීක්ෂා කිරීමද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ)ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඉ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

ව්‍යාපෘතියේ මෙහෙයුම් උපදෙස් අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රතිපත්තිමය ගැටළු හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව මාස තුනකට වරක් රැස්විය යුතුය. කෙසේ වෙතත් 2014 වර්ෂය තුළදී එක් ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

අරමුදල් මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2014දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ වටිනාකම | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | **2014** දෙසැම්බර් **31** දිනට | |
| | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) |
| ජ.අ.ස.නි | 2,575 | 2,704 | - | 286.09 | 362.93 | 2,435 | 3,325 |
| ශ්‍රී.ලං.ර | 184 | 372 | 576 | - | 19.02 | - | 124 |
| එකතුව | 2,759 | 3,076 | 576 | 286.09 | 381.95 | 2,435 | 3,449 |

රු. මිලියන 2,704 කට සමාන ජපන් යෙන් මිලියන 2,575 ක මුළු ප්‍රතිපාදනයෙන්, ප්‍රතිලාභින් වෙත අතුරු ණය ලබා දීම සඳහා රු. මිලියන 2,420 කට සමාන ජපන් යෙන් මිලියන 2,305 ක් ප්‍රතිපාදනය කළ අතර 2014 දෙසැම්බර් 31 දිනට එම සම්පූර්ණ ප්‍රතිපාදනයම අදාල කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර තිබුණි. රු. මිලියන 223.88 කට සමාන ජපන් යෙන් මිලියන 176 ක වෙන්කිරීම උපදේශක සේවා සහ ධාරිතා සංවර්ධන සංරචකය යටතේ සිදු කර තිබුණු අතර එයින් ජපාන යෙන් මිලියන 73.9 ක් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි.

**3.2 වියදම් වාර්තා පරිපාටි භාවිතය සම්බන්ධ අඩු පාඩු**

-----------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ රු. මිලියන 14.7 ක් වූ වේතන සහ ක්ෂේත්‍ර නිලධාරින්ට ගෙවන ලද රු. මිලියන 6.8 ක් අනෙකුත් දීමනා ණය දීමේ නියෝජිතායතනයෙන් 2014 දෙසැම්බර් 31 දින වනවිටත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ආ)2014 ට පෙර සිදු කරන ලද එකතුව රු. මිලියන 3.3 ක ක්ෂේත්‍ර නිලධාරින් සඳහා වන දීමනා ව්‍යාපෘතිය විසින් උපකරණ සංරචකය යටතේ ඉල්ලුම්කර තිබුණු අතර එය නියෝජිතායතනය විසින් ආපසු එවා තිබුණි.

**3.3 භෞතික කාර්යසාධනය**

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)ව්‍යාපෘති ලියවිලිලෙහි 13 වන ජේදය අනුව, අවම වශයෙන් අතුරු ණය ලබාදීම සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක් උතුරු සහ නැගෙනහිර පළාත්වල ජීවත් වන ප්‍රතිලාභින් හට ලබා දීම අවශ්‍ය වේ. කෙසේ වෙතත් උතුරු පළාතේ ප්‍රතිලාභීන් වෙත මුළු ණය ප්‍රමාණයෙන් සියයට 24 ක් වන රු. මිලියන 755.5 ක් වූ අතුරු ණය 12,286 ක් පමණක් ලබා දී තිබුණි. තවද, කිලිනොච්චි, මන්නාරම, වව්නියා හා මුලතිව් දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන් හට ලබා දුන් අතුරු ණය මුදල්වල ප්‍රගතිය 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ලබා දුන් අතුරු ණය වල මුළු වටිනාකමෙන් සියයට 5 කට වඩා අඩුව පැවතිණි.

(ආ)ඊට අමතරව වයඹ, උතුරු මැද, ඌව සහ සබරගමුව පළාත් වල ප්‍රතිලාභීන් වෙත මුළු ණය ප්‍රමාණයෙන් සියයට 34 ක් වන රු. මිලියන 1,070.1 ක් වටිනා අතුරු ණය 20,564 ක් පමණක් ලබා දී තිබුණි.

(ඇ) තවද, කෘෂිකර්ම, පශු සම්පත් සහ වෙළඳ හා සේවා ආදී අනෙකුත් අංශයන් සඳහා රු.මිලියන 2,445 ක් වූ අතුරු ණය 46545 ක් ලබා දී තිබු නමුත් ධීවර හා කුඩා කර්මාන්ත අංශ සඳහා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් රු. මිලියන 681 ක් වූ අතුරු ණය 11,859 ක් පමණක් ලබා දී තිබුණි.

**3.4 චක්‍රීය අරමුදල**

--------------

ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4 (1) වගන්තියඅනුව, චක්‍රීය අරමුදල් ගිණුමක් 2011 අගෝස්තු වලදී ශ්‍රී ලංකා මහ බැංකුවේ විවෘත කර තිබුණි. ණය අයකිරීමේ අරමුදල් වලින්, අතුරු ණය අරමුණු සඳහා ණය මුදාහැරීම් 2013 දී ආරම්භ කර තිබුණි. එම නිසා 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමූල්‍ය ණය වටිනාකම රු. මිලියන 2,748 ක් චක්‍රීය අරමුදලින් මුදාහැර තිබුණි.